රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 05/94

මගේ අංකය: III/163/8/28/එල්/එල්/II,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994 ජනවාරි 20 දින.

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

## රාමසාන් සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම.

1993 පෙබරවාරි 25 වැනි දින අංක 05/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරවමි.

02. 1994 වර්ෂයේ රාම්ලාන් (රාමසාන්) උත්සව සමයේදී මුස්ලිම් භක්තික රාජ්‍ය නිලධාරීන්ට/සේවකයින්ට යාඥ සහ ආගමික වතාවත්වල නිතර විය හැකිවන පරිදි වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

03. ආගමික සහ යාඥ කටයුතු දිනපතා සිදු කෙරෙන කාල වේලාවන් පහත දැක්වෙන පරිදි වේ.

* පෙරවරු 3.00 සිට පෙරවරු 5.30 දක්වා
* පෙරවරු 6.00 සිට පෙරවරු 7.00 දක්වා
* පස්වරු 6.00 සිට පස්වරු 7.00 දක්වා
* පස්වරු 8.00 සිට රාත්‍රී 10.00 දක්වා

04. මෙම කාලසීමාවන් තුළදී ආගමික වතාවත්වල යෙදීමට හැකි වන පරිදි සෑම විටම වැඩ මුර සකස් කර දිය යුතුය. එහෙත් අත්‍යාවශ්‍ය අවස්ථාවලදී විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

05. තවද 1994 රාම්ලාන් (රාමසාන්) අවසන් වීමේ දිනට දින 14 කට කලින් රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධාරීන්ට/සේවකයින්ට උත්සව අත්තිකාරම් මුදල් ලබා දීමට ද කටයුතු කිරීම මැනවි.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.